# 01 තිලොවග බුදු පදවි ලබති

සතර පෙර නිමිති දුටු අප සිදුහත් බෝසතාණන් වහන්සේට මහලු වීම, ලෙඩ වීම, මරණය යනාදී විපත්වලින් පිරුණු ජීවිතයේ ඇලී ගැලී සිටීමේ හරයක් නොමැති බව වැටහිණ. එනිසා මේ දුක් ගිනිවලින් තොර වූ නිවීමක් සොයා යන්නට උන්වහන්සේ තීරණය කළහ. ඒ අනුව ඇසළ පොහෝ දිනක මහාභිනිෂ්ක්‍රමණය කළ සේක. අවුරුදු විසි නවයේ (29) දී මෙසේ රජසැප හැරදමා සත්‍යය සොයා යන උන්වහන්සේට මුලින් ම ආළාර කාලාම යන ගුරුවරයාත් දෙවනුව උද්දකරාමපුත්ත යන ගුරුවරයාත් මුණ ගැසුණි. සිදුහත් බෝසතාණෝ ඔවුන්ගෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය දක්වා අෂ්ට සමාපත්ති පුරුදු පුහුණු කළහ. එහෙත් එය දුක නිවීමට මග නොවන බව උන්වහන්සේට වැටහිණ.



ඉන් අනතුරුව ශරීරයට අපමණ දුක් දෙමින් දුෂ්කර ක්‍රියාව ආරම්භ කළහ. උන්වහන්සේ මෙම කාලය තුළ තම සිරුරට මිනිසෙකුට විඳිය නොහැකි තරම් උපරිම දුක් දෙමින් සත්‍යය සෙවූහ. මෙය අත්තකිලමථානු යෝගය ලෙස හැඳින්වේ. මේ කාලය තුළ උන්වහන්සේට උපස්ථාන කළේ කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන තවුසන් පස්දෙනා ය. කෙසේ වූවත් ශරීරයට දුක් දීම ද සත්‍ය සෙවීමේ නිසි මග නොවන බව උන්වහන්සේට අන්තිමේ දී

වැටහිණ. එබැවින් ශරීරයට අපමණ දුක් දීමත්, සැපදීමත් යන අන්ත දෙකින් ම මිදී මධ්‍යම ප්‍රතිපදාවට පිවිසුණහ. පිණ්ඩපාතයෙන් යැපෙමින් ශරීරයේ දුබල බව දුරුකරගෙන සත්‍යය සෙවීමේ උත්සාහය අත්නොහැර දිගමට භාවනාවෙහි යෙදුනහ. ශරීරයට සැපදීමෙන් කිසි දා බුදුවිය නොහැකි යැයි ඇදහූ පස්වග තවුසෝ මේ අවස්ථාවේ දී කළකිරී උන්වහන්සේ අතහැර ගියහ.

වෙසක් මස තුදුස්වක දිනය උදා විය. උන්වහන්සේ පිඬු පිණිස සේනානි නම් නියම් ගම බලා වැඩියහ. කාලය එළඹෙන තුරු එහි අජපාල නුගරුක මුල වැඩ සිටින අතර සුජාතා නම් සිටුදුවක් පුණ්ණා නම් දාසිය ද කැටුව දිය නොමුසු කිරිබතක් රැගෙන එහි ආවා ය. රුක් දෙවියාට භාරයක් ඔප්පුකිරීමට ගෙන ආ එම පූජාව රන්තලිය ද සමගින් ම බෝසතාණන් වහන්සේට පුදා ''මාගේ පැතුම ඉටුවූවා සේ ම ඔබ වහන්සේගේ පැතුමත් ඉටුවේවා'' යි කියා ඕතොමෝ පිටත් ව ගියා ය.

එම කිරිබත සහිත රන්තලිය රැගෙන බෝසතාණන් වහන්සේ වැඩම කළේ නේරංජනා ගංතෙරට ය. එහි දිය නා කිරිබත රැගෙන පිඬු හතළිස් නවයක් කොට වැළඳූහ. උන්වහන්සේට එය, ඉදිරියට ගතකිරීමට ඇති දින හතළිස් නවයකට ප්‍රමාණවත් විය. වළඳා රන්තලිය නේරංජනා නදියට දැමූ උන්වහන්සේ '' ඉදින් අද මා බුදුවන්නේ නම් මේ රන්තලිය උඩුගං බලා යේවා යි '' අධිෂ්ඨාන කළහ. රන්තලිය උඩුගං බලා ගමන් කළේ ය. එදින ම බුදුබව ලැබීම නියත බව එයින් පසක් විය.

සවස් කාලයේ ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ දෙසට වැඩම කරන උන්වහන්සේට සොත්ථිය නැමැති බමුණෙක් කුසතණ අට මිටක් පූජා කළේ ය. උන්වහන්සේ බෝධි මූලයේ නැගෙනහිර දිසාව බලා කුසතණ අසුනක් සේ අතුරාගෙන එහි වැඩහුන් හ. එසේ වැඩහිඳිමින් සතර ආකාරයකින් දැඩි වීර්යයක්, දැඩි අධිෂ්ඨානයක් උපදවා ගත්හ.

1. සිරුරේ සම ගැලවී විසිර ගියත් බුදු වී මිස නො නැගිටිමි.
2. සිරුරේ නහර ගැලවී විසිර ගියත් බුදු වී මිස නො නැගිටිමි.
3. සිරුරේ ඇට කටු ගැලවී විසර ගියත් බුදු වී මිස නො නැගිටිමි.
4. සිරුරේ මස් ලේ වියළී ගියත් බුදු වී මිස නො නැගිටිමි.

යනු ඒ සතර යි.

'' චතුරංග සමන්නාගත වීර්යය '' ලෙස හැඳින්වෙන්නේ එය යි.

මේ මොහොතේ උන්වහන්සේගේ බුදුවීමේ අදහස දැන වහා එහි ආ වසවත් මරු උන්වහන්සේ බියකර පළවා හැරීමට සුළඟ, වැස්ස, ගල්, ආයුධ, අඟුරු, අළු, වැලි, මඩ, අඳුර යන බිහිසුණු වර්ෂා නවයක් වැස්ස වීය. ඒ සෑම වර්ෂාවක් ම උන්වහන්සේ වෙත ළඟා වූයේ පූජාවන් ලෙස ය. උන්වහන්සේට බිඳකුදු හානියක් නොවී ය. කිසිවක් කර කියාගත නොහැකි වූ මාරයා තමා ම පැමිණ උන්වහන්සේට අභියෝග කර සිටියේ ය. '' ශ්‍රමණ ගෞතමයනි, ඔය වජ්‍රාසනය මගේ යැයි '' හේ ගුගුළේ ය. ''ඔබට ඊට ඇති සාක්ෂි මොනවාදැ'යි බෝසතාණෝ විමසූහ. මාරයා තම සේනාව දෙස අත දිගු කළේ ය. දස බිම්බරක් සෙනග ''අපි සාක්කි''යැයි නැගූ හඬින් මුළු ලෝක ධාතුව ම ගිගුම් දුන්නේ ය. ගෞතමයනි, ඔබට මෙහි ඇති අයිතිය කුමක්දැයි මාරයා විචාළේ ය. '' මෙහි මට සාක්ෂියට කිසිවෙක් නැත. එහෙත් මේ සඳහා මා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් දානාදී පාරමිතා පිරූ බවට මේ මිහිකත සාක්ෂි යැ'යි උන්වහන්සේ මහපොළව දෙසට අත දිගු කළහ. එකෙණෙහි කම්පා වූ මහපොළව ඉවසිය නොහැකි තරම් මහා ගර්ජනාවකින් ගුගුරා ගියේ ය. බියපත් මරසෙනඟ හිස් ලූ ලූ අත පලා ගියෝ ය.

අනතුරුව එහි රැස්වූ ගරුඬ, නාග, දිව්‍ය බ්‍රහ්ම සමූහයා බුදුරදුන්ට මෙසේ ස්තුති ගීතිකා ගයමින් ප්‍රීතිඝෝෂා කරන්නට වූහ.

ජයො හි බුද්ධස්ස සිරීමතො අයං
මාරස්ස ච පාපිමතො පරාජයො
උග්ඝොසයුං බොධිමණ්ඩෙ පමොදිතා
ජයං තද දෙව ගණා මහෙසිනො

'' මහා සිරි සැපතින් හෙබි මුනිවරයාණන් වූ බුදුරදුන්ට ජය අත්විය. පාපී වූ මාරයාට පරාජය අත් වී යැයි එද බෝ මැඩට රැස් වූ දේව සමූහයා බුදුරජාණන් වහන්සේට ජය ඝෝෂා නැගූහ. ''

රාත්‍රියේ පළමු යාමය උදාවිය. ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතිය ධ්‍යානය, චතුර්ථධ්‍යානය යන ධ්‍යාන පසුකොට උන්වහන්සේ පෙර

ආත්ම භාවයන් දැකීමේ නුවණ වූ **පුබ්බේනිවාසානුස්සති ඤාණය** උපදවා ගත්හ. රාත්‍රියේ මධ්‍යම යාමය වනවිට අනෙකුත් සත්ත්වයන්ගේ ඉපදීම මියයෑම, සුගති, දුගති ආදිය දතහැකි **චූතූපපාත ඤාණය** හෙවත් **දිබ්බචක්ඛු ඤාණය** උපදවා ගත්හ. රාත්‍රිය අවසාන භාගයේ හෙවත් පශ්චිම යාමයේ සියලු කෙලෙසුන්ගෙන් මිදීමෙන් ලබන **ආසවක්ඛය ඤාණය** අවබෝධ කොට වදාළහ. මෙසේ වෙසක් පුර පසළොස්වක පුන් පොහොදා අළුයම උන්වහන්සේ සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමිතා බලය මුදුන්පත් කරමින් සියලු කෙලෙසුන් නසා සර්වඥතා ඤාණය අවබෝධකර ගෙන උතුම් වූ සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. එ සැණින් සියලු බුදුවරුන් බුදු වූ මොහොතේ පළකරන ප්‍රීති වාක්‍යය මෙසේ පළකර වදාළහ.

'' නැවත නැවත ඉපදීම දුකකි. එබැවින් මේ පඤ්චස්කන්ධය නැමැති ගෙය සාදන වඩුවා සොයමින් මෙතෙක් කල් සසර සැරිසැරූයෙමි. තණ්හාව නමැති වඩුව, මා විසින් නුඹ දක්නා ලද්දෙහි ය. කෙලෙස් නැමැති පරාල බිඳ දැමුවෙමි. නැවත නුඹ මට ආත්මභාව නැමැති ගේ නොතනන්නෙහි ය. අවිද්‍යා නැමැති කැණිමඬල සුණු විසුණු කරන ලදී. තණ්හාව සිඳී ගියේ ය. මාගේ සිත නිවනට පත්විය.'' යනු උන්වහන්සේගේ ප්‍රීති උදාන ය යි.

**පුහුණුවට**

අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසී
සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා

**අභ්‍යාස**

1. පහත සඳහන් විද්‍යාවන්ගේ සිංහල තේරුම් මතකයෙන් කියන්න.

I. පුබ්බේ නිවාසානුස්සති ඤාණය
II. චුතූපපාත ඤාණය
III. ආසවක්ඛය ඤාණය

02. දසබිම්බර මාර සෙනග බුදුන් වහන්සේට කරදර කළ අයුරු චිත්‍රයට නගන්න.